# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1988 අංක 23 දරන ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1088 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IIවන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 60 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 23 දරන ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 26/87

**ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය" යනුවෙන් හැඳින්වෙන සහ සඳහන් කරනු ලබන සමිතියක් අර්ධ ශත වර්ෂයකට අධික කාලයක සිට එකී සමිතියේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී සමිතිය හා සම්බන්ධ සියලුම කරුණු සඵලාකාරයෙන් සාක්ෂාත් කර ගැනීම සහ ඉටු කිරීම පිණිස පිහිටුවා පවත්වා ගෙන ගොස් ඇති හෙයින් ද : පූර්විකාව.

එම සමිතිය පිහිටුවීමේ පරමාර්ථ සහ කරුණු එකී සමිතිය විසින් මෙතෙක් කල් සාර්ථකව ඉටු කරගෙන ගොස් සහ ක්‍රියාත්මක කොට ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 23 දරන ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතියේ සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් බවට පත් වන්නේය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද තමන් කැමති පරිදි එය වෙනස් කිරීමේ සහ අමුතු කිරීමේ ද බලය සහ අධිකාරය එයට ඇති අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. ශ්‍රී ජයවර්ධනපුර පිටකෝට්ටේ එක්සත් අවමංගල්‍යාධාර (ශවකෘත්‍යාධාර) සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි වන්නේය :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සංස්ථාවේ යථා පරිදි ලියාපදිංචිව ඇති සාමාජිකයකුගේ හෝ යථා පරිදි ලියාපදිංචි කර ඇති යැපෙන්නකුගේ අවමංගල්‍යයක දී සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති වලට අනුව ආධාර දීම ;

(ආ) අසරණයකුගේ මරණයක දී අවමංගල්‍ය සඳහා වියපැහැදම් කරගත නොහැකි ශෝකයට පත් ඥාතියකු විසින් කෙරෙන **ඉල්ලීමක් අනුව මුදලින් ආධාර කිරීම ;**

(ඇ) ජාති, කුල, ආගම් හෝ පන්ති භේදයකින් තොරව සියලු දෙනා කෙරෙහි සමානාත්මතා හැඟීම අභිවර්ධනය කිරීම ;

(ඈ) ඉහත සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ ද මේ පනතේ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට අනනුකූල නොවූ ද වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද නිලධරයන් සහ සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින්, ඒ රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සමිතියේ ධුර දැරූ විධායක කාරක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

6. (1) විධායක කාරක සභාව හා වෙනත් නිලධරයන් තෝරා පත් කර ගැනීම සහ සාමාජිකයන්ගෙන් යැපෙන්නන් ලියාපදිංචි කිරීම ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගෙන යෑම සඳහා අවශ්‍ය වන්නා වූ ද යථා පරිදි කැඳවනු ලැබූ විධායක කාරක සභා රැස්වීමක දී එහි තුනෙන් දෙකක ඡන්දයෙන් පූර්ව අනුමැතිය දෙනු ලැබුවා වූ ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධාන වලට අනනුකූල නොවන්නා වූ ද රීති, සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී හෝ විශේෂ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයකින්, කලින් කල, සංස්ථාව විසින් සාදනු ලැබීම හිතානුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

මුදල් සහ දේපළ යෙදවීම.

7. අපේක්ෂා කරන කවර අවස්ථාවක දී වුව ද සංස්ථාවේ මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ම පමණක් යෙදිය යුතු අතර ඉන් කවර වුව ද කොටසක් ලාභාංශ වශයෙන් හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයක ලාභ වශයෙන් හෝ කෙලින් ම නැතහොත් අන්‍යාකාරයකින් සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවීම නොකළ යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල නියාදනයක් කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සමිතිය සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපලක් භාර ගැනීමට හා දැරීමට සමිතියට නීතියෙන් බලය ඇති අතර, ඒ දේපල විකිණීමට, උකස් කිරීමට, බද්දු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට සම්පූර්ණ බලය සහිතව එවකට බලාත්මකව පවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සමිතිය විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. විධායක කාරක සභාවේ බලය යටතේ සහ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනාගෙන් එක් අයකු සංස්ථාවේ ලේකම්වරයා හෝ තත් කාර්යය සඳහා විධායක කාරක සභාව විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විය යුතුය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් තමන්ගේ නම් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු අතර එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවන් වශයෙන් එකී ලේඛනය අත්සන් කරන යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ශේෂ වන දේපළ.

10. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණයතුරුස් සහ බැඳීම් නිදහස් කිරීමෙන් පසු යම් දේපළක් ඉතිරි වේ නම් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය ආදායම හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතරේ බෙදා හැරීම ස්වකීය රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද සමිතියක හෝ සමිති වෙත ඒ දේපළ දීම හෝ හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එසේ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුත්තේ කිනම් සමිතියකට හෝ සමිතිවලට ද යන වග සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලැබිය යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැහැර නොකළ හැකි වේ නම් ඒ දේපළ හෝ ඒ කොටස සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලබන යම් පුණ්‍ය කටයුත්තක් සඳහා යෙදවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.